# ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**<u>ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පුරප්පාඩුව පවතින සංවර්ධන නිලධාරී සේවයේ (පුරප්පාඩු 07) සහ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ (පුරප්පාඩු 04) තනතුරු සඳහා අනුයුක්ත කර ගැනීමට අයදුම්පත් කැඳවීම.</u>**

ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා පහත සුදුසුකම් සපුරා ඇති <u>දැනට රාජ්‍ය සේවයේ නියැලී සිටින</u> නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- සංවර්ධන නිලධාරී - විද්‍යාවේදී ( භෞතික විද්‍යා හෝ ජීව විද්‍යා), හෝ නීතිවේදී හෝ (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 07කි.) වාණිජවේදී හෝ විද්‍යාවේදී (කළමනාකරණ) උපාධියක් ලබා ඇති සංවර්ධන නිලධාරියෙකු වීම.

මෙම දෙපාර්තමේන්තුව ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ආසියා ශාන්තිකර කලාපීය රටවල්හි බුද්ධිමය දේපළ කාර්යාල වැනි විදෙස් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී රාජකාරී ඉටුකරන රජයේ දෙපාර්තමේන්තුවකි. එබැවින් මෙම කාර්යලයේ බුද්ධිමය දේපළ විෂයට අදාළ අංශවල සේවයේ නියුතු නිලධාරීන්ට තම රාජකාරියේ ස්වභාවය අනුව විදෙස් පුහුණු/සම්මන්ත්‍රණ ආදියට සහභාගි වීමේ අවස්ථාවන් ද හිමි වේ. ඉංග්‍රීසි භාෂාවෙන් රාජකාරී කටයුතු කිරීමට හැකි වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

- රාජ්‍ය කළමනාකරණ සහකාර - (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 04කි.)

මෙම දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට කැමති ඉහත තනතුරු දරන <u>දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්</u> තමන් විසින් ම සකසාගත් අයදුම්පත්‍රයක් 2017.02.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලට යොමු කරන්න. කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සටහන් කළ යුතුය.

අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හරහා අයදුම්පත එවිය යුතු අතර අනුප්‍රාප්තිකයෙක් සහිතව / රහිතව නිදහස් කළ හැකි ද යන්න තහවුරු කළ යුතුය.

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය:
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
"සමාගම් මැදුර"
3වන මහල
අංක 400
ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10

දුරකතන අංකය : 0112 689 368

බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

රේඛීය අමාත්‍යාංශය – කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය